# Abstract 37

## පිරිත් දේශනාව හා රෝග නිවාරණය පිළිබඳ සමීක්ෂණයක්

**ජී. යූ. සී. ප්‍රනාන්දු,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*udarachinthaka019@gmail.com*

පිරිත් දේශනාවෙන් අපේක්ෂිත කාර්යය වන්නේ දුක්ඛ, රෝග හා භය නිවාරණය යි. මේවායින් රෝග, **කායික රෝග** හා **මානසික රෝග** යනුවෙන් කොටස් දෙකකට බෙදේ. සැබැවින් ම පිරිත් දේශනාවෙන් රෝග සමනය කළ හැකි ද, එසේ නම් ඊට නිර්දේශිත ක්‍රමවේදය කුමක් ද යන්න හඳුනාගත යුතු කරුණක් වේ. රෝග සමනය අරමුණු කොට දේශිත සූත්‍ර විශාල සංඛ්‍යාවක් දක්නට ලැබේ. **රතන සූත්‍රය, බොජ්ඣංග සූත්‍ර, ආටානාටිය සූත්‍රය, ගිරිමානන්ද** වැනි සූත්‍ර පමණක් නොව **චතුභාණවාරපාළියට** ඇතුළත් නො වන **ජ්වරපරිත්ත, අංගුලිමාල** වැනි සූත්‍ර ද ඒවා අතර වේ. මේවායින් ඇතැම් සූත්‍ර බුදුරදුන් විසින් ම දේශිත සූත්‍ර බව හඳුනා ගැනීමට සාධක පවතින අතර ඇතැම් සූත්‍ර ගුප්ත ශාස්ත්‍රය පිළිබඳ විශේෂඥ වූ කිසියම් තෙරවරුන් විසින් සම්පාදිත බව ද හැඟේ. කෙසේවෙතත් මේවා රෝග සමනය කිරීම විෂයයෙහි භාවිත කළ හැකි **ධාරණී** විශේෂයක් වශයෙන් සැලකීමට හැකි ය. මහායානික බෞද්ධ සම්ප්‍රදාය තුළ පවා මේවා භාවිත කරගන්නා හෙයින් **වජ්‍රයානය (තන්ත්‍රයානය)** වැනි බෞද්ධ සම්ප්‍රදායයන්ගෙන් ගත් ඒවා වන්නට ද ඉඩ ඇත. කෙසේවුවත් දීර්ඝ කාලයක් තුළ අත්හදා බැලීම් අනුව තහවුරු වූ දේශනා විශේෂයක් වශයෙන් මෙකී සූත්‍ර හඳුනාගත හැකිව පවතී. බුදුන් වහන්සේ එම සූත්‍ර රෝග නිවාරණය කිරීම සඳහා දේශනා කිරීමට නිර්දේශ කිරීමත් ඒවායෙන් ප්‍රත්‍යක්ෂ ප්‍රතිලාභ සිදුවීමත් වර්තමානයෙහි ද යක්ෂ භූතාදීන් පවා මේවා මගින් දමනය කිරීමක් සිදුකෙරෙන නිසාත් මෙහි සත්‍යතාව පිළිගැනීමට සිදු වේ. එහෙත් මෙය රෝහලකින් ප්‍රතිකාර ලබා දීමෙන් රෝගීන් සුවපත් කරන්නාක් මෙන් සිදු කළ හැකි ක්‍රියාදාමයක් නොවේ. ශක්ති පිහිටුවා පබඳින ලද සූත්‍ර නිසි පරිදි උච්චාරණය, පිරිත් මණ්ඩප, අලංකරණ විධි, මල්පහන් දැල්වීම්, දේවතාරාධනා යනාදී අවශේෂ පූර්ව කෘත්‍යයන් රාශියක් සමඟ ප්‍රතිබද්ධ වූවකි. මෙම පර්යේෂණයෙන් කෙරෙනුයේ රෝග නිවාරණය කිරීම සඳහා බෞද්ධ පිරිත් සූත්‍ර යොදා ගත හැකි ආකාරය හා ඒ සම්බන්ධ අවශේෂ අභිචාර විධි පිළිබඳ ගවේෂණයකි.

**ප්‍රමුඛ පද :** අභිචාර විධි, කායික රෝග, පිරිත, මානසික රෝග, රතන සූත්‍රය